**ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2022**

---

**ඔපෙක් අරමුදලින් මුල්‍යයනය කරන කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, නාවික කටයුතු හා මහා මාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන ජාතික මාර්ග 13ක කිලෝමීටර් 65.45ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට- නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 11,212.37කට සමාන එ.ජ.ඩො. මිලියන 86.25ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57කට සමාන එ.ජ.ඩො.මිලියන 50ක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය 2024 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යන කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධව විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය

හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩුව/ විගණන නිරීක්ෂණය | මුදල රු. මිලියන | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශයය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 5 හි 43 (අ) වගන්තියට අනුව, එක් එක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සඳහා වත්කම් සහ බැරකම් මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කිරීමේ දිනයේ විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, ඉහත අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතියේ විදේශ ණය සම්බන්ධ විනිමය අනුපාත ගැලපීම් සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කර නොතිබුණි. | 7,179 | අප විසින් ලබා දී ඇති සත්‍ය මුදල සටහන් කර ඇති අතර විදේශ ණය වාර්තා කිරීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට විනිමය අනුපාතිකය සලකා බලනු නොලබයි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ සම්පූර්ණ විසර්ජන මුදල රු. මිලියන 608 ක් වුවද, එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ රුපියල් මිලියන 1,067 ක් ලෙස පෙන්වා දී තිබුණි. | 608 | 2022 වර්ෂය සඳහා ලබා දී ඇති මුළු මුදල රු. මිලියන 607.85 කි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියට පෙර වසරවල ලැබී ඇති මුදල් සමඟ රු.මිලියන 1,067.16 ක් | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දක්වා තිබුණි. | |
| (ඇ) | විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාවට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියට ලැබී ඇති සම්පූර්ණ මුදල් ප්‍රමාණය රු. මිලියන 542 ක් වූ නමුත් එය රු. මිලියන 608 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබූ අතර, ඒ අනුව රු. මිලියන 66 ක වෙනස සඳහා සැසඳීම් කර නොතිබුණි. | 66 | ERD හරහා ගෙවීම් සඳහා IPC ඉදිරිපත් කර ඇති බැවින්, රු. මිලියන 65.88 ලැබිය යුතු විදේශ ආධාර ලෙස පෙන්වා ඇත. | ERD වාර්තා සහ රාජ්‍ය ගිණුම් සැසඳීම් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | රු. මිලියන 1.16 ක් වටිනා සම්පූර්ණයෙන් ක්ෂය වූ පරිගණක 11 ක් තවදුරටත් භාවිතා කරමින් සිටියද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 වැනි වගන්තිය අනුව වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ප්‍රකාරව ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 1.16 | එකඟ වේ.<br>2023 වර්ෂයේදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය අංක 07 හි 65 වැනි වගන්තියට අනුව දෝෂය නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව, ව්‍යාපෘතියට එරෙහි අධිකරණ නඩු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | - | එකඟ වේ. 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුගත විය යුතුය. |

2.2 නොපියවූ ශේෂයන්

| විස්තරය | මුදල රු. මිලියන | නොපියවූ කාලසීමාව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වසර 01 සිට 02 දක්වා කාලය තුළ වෙළඳ දැන්වීම්, මැනුම් කටයුතු, නායයෑම් අධ්‍යයනය, පදික වේදිකාව සැලසුම් කිරීම සහ පාරිසරික උපදේශන වියදම් සඳහා ලැබිය යුතු රු. මිලියන 15ක ශේෂ 03 ක් අයකර ගැනීමට ව්‍යාපෘතිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 15 | වසර 1 සිට 2 දක්වා | ප්‍රමාණවත් අග්‍රිම ලැබුණු පසු, අදාළ ව්‍යාපෘතිවලින් ලැබිය යුතු ශේෂ අය කර ගනු ඇත. | ප්‍රමාදයකින් තොරව ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

3. භෞතික කාර්යසාධනය

**3.1** ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| සංරචකය | ක්‍රියාකාරකම | 2022 දෙසැම්බර් 31 දිනට | | විගණන නිරීක්ෂණය | ප්‍රමාද සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය ප්‍රතිශතය | ළඟා කරගෙන ඇති කාර්යසාධනය ප්‍රතිශතය | | |
| ඔරුගොඩවත්ත-අඹතලේ මාර්ගය (අදියර-01) (අදියර-02) | මාර්ග ඉදි කිරීම් | 100<br>100 | 84<br>79 | අදාළ මාර්ගවල සත්‍ය ප්‍රගතිය සැලසුම් කළ ප්‍රගතියට වඩා අඩුවෙන් පැවතුණි. | කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතුවල ප්‍රමාදය. |

| | |
|---|---|
| කළමනාකරණයේ ප්‍රතිචාරය | එකඟ වේ.<br>කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ ඉඩම් අත්පත් කර ගැනීම සහ උපයෝගිතා සේවා ආශ්‍රිත කටයුතු වැනි අනෙකුත් ක්‍රියාකාරකම් ද ව්‍යාපෘතියේ ප්‍රමාදයට බලපා ඇත. |
| විගණකගේ නිර්දේශය | නියමිත දින තුළ මාර්ග ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| පිළියන්දල සිට මහරගම මාර්ගය වැඩිදියුණු කිරීම සඳහා 2022 මාර්තු 07 දිනැති පුවත්පත් දැන්වීම මගින් ටෙන්ඩරයක් කැඳවා තිබුණද 2022 දෙසැම්බර් 31 දින දක්වාත් කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය ප්‍රධාන වශයෙන් එම ප්‍රමාදයට බලපා තිබුණි. | එක් ලංසුකරුවෙකු විසින් ප්‍රදානයට එරෙහිව FR සම්බන්ධ නඩුවක් ගොනු කර ඇති අතර එය ප්‍රදානය කිරීම ප්‍රමාද වීමට ප්‍රධාන හේතුව වේ. | නියමිත පරිදි සිවිල් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධ ගැටලු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ලැබී ඇති තොරතුරුවලට අනුව, ව්‍යාපෘති කටයුතු සඳහා රජයේ ඉඩම් කට්ටි 962 ක් ඇතුළුව ඉඩම් කට්ටි 5,717 ක් අත්පත් කර ගැනීමට නියමිතව තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට වන්දි ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් ඉඩම් කට්ටි 4,410 ක් සඳහා රු. මිලියන 2,192 ක ප්‍රමාද පොලී ඇතුලුව වන්දි මුදල් රු. මිලියන 12,275 ක් ව්‍යාපෘතිය මගින් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, 2022 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ ඉඩම් කට්ටි 514 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. තවද, එය ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපෑ හැකිය. | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වැනි වගන්තිය යටතේ අත්පත් කරගත් ඉඩම් ලියාපදිංචි කිරීම අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල (DSS) විසින් සිදු කරනු ලැබේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ ප්‍රමාදයක් ඇති අතර එය සම්පූර්ණ කිරීම සඳහා සිහි කැඳවීම් කිහිපයක් යවා ඇත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.4** නිෂ්ක්‍රීය/ අක්‍රීය/ ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙළින් රු. මිලියන 1,150 ක් සහ රු. මිලියන 585 ක් විදේශ ණය සහ GOSL සංරචකය යටතේ ප්‍රතිපාදන ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල දුර්වල ප්‍රගතිය හේතුවෙන්, සියයට 7ක් නියෝජනය වන පරිදි රු. මිලියන 83 ක විදේශ ණය ප්‍රතිපාදන සහ සියයට 79 ක් නියෝජනය කරමින් රු. මිලියන 465 ක ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන ව්‍යාපෘතිය මගින් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | GOSL සංරචකය යටතේ ප්‍රමාණවත් පරිදි අග්‍රිම නොලැබුණි. එබැවින්, GOSL ප්‍රතිපාදනවලින් සියයට 79 ක් භාවිතා නොකරන ලදී. | ණය අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

3.5 පද්ධති හා පාලනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ගොඩනැගිල්ලේ පළමු මහලේ ව්‍යාපෘති කාර්යාල හතක් පවත්වාගෙන ගොස් තිබුණද මෙම ව්‍යාපෘති හත අතර සාධාරණ ලෙස ගොඩනැඟිලි කුලිය බෙදා නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා මාස 03ක කුලිය රු. මිලියන 3.16 ක් ගෙවා තිබුණි. | එකඟ වේ. | එක් එක් ව්‍යාපෘතිය සඳහා කුලි ගාස්තු වෙන් කිරීමට කටයුතු කළ යුතුය. |